# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව.

செயலகம், கொழும்பு 01.
இலங்கை.

The Secretariat, Colombo 01.
Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: +94-11-2484500, +94-11-2484600, +94-11-2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: +94-11-2449823

වෙබ් අඩවිය / வெப்சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No.: BD/RDS/106/07/04

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதி / Date: 2014.12.29

**ජාතික අයවැය චක්‍රලේඛ අංක 152 (III)**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

## <u>පවත්නා ආපදා තත්ත්වය යටතේ විපතට පත්වූවන්ට සහන සැලසීම සඳහා වූ විශේෂ චක්‍රලේඛය</u>

දිවයිනට බල පා ඇති දරුණු ගංවතුර / නායයෑම් / දැඩිසුළං ආපදා තත්ත්වයන් හමුවේ පීඩාවට පත්ව ඇති ජනතාවට කඩිනම් සහන සැලසීම සඳහා මෙම ආපදා අවස්ථාවට පමණක් බලපාන පරිදි මෙම විශේෂ චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

ජාතික අයවැය චක්‍රලේඛ අංක 152 (1) සහ 152 (II) හි විධිවිධාන වලින් ආවරණය නොවන සහනාධාර සඳහා මෙම විශේෂිත චක්‍රලේඛය නිකුත් කරනු ලබන අතර, මෙමගින් සපයනු ලබන සහනාධාර ගංවතුරෙන් / නායයෑමෙන් යට වූ, කොටු වූ, වට වූ සහ ජීවනෝපාය අහිමි වූ සියළු ජනතාව වෙත සැලසිය යුතු වේ.

**01.** <u>පිසූ ආහාර</u>

සුබසාධන මධ්‍යස්ථාන වල රඳවා ඇති පීඩාවට පත් වූ ජනතාව සිය මුල් වාසස්ථාන වල නැවත පදිංචියට යන තෙක් ඔවුන් සඳහා ජාතික අයවැය චක්‍රලේඛ අංක 152 (1) හි විධිවිධාන යටතේ පිසූ ආහාර අඛණ්ඩව සැලසිය යුතුය.

**02.** <u>වියළි සලාක සැපයීම</u>

2.1 සුභසාධන මධ්‍යස්ථාන වල රඳවා ඇති පීඩාවට පත් වූ ජනතාවගේ මුල් වාසස්ථාන යථා තත්ත්වයට පත්කොට ඔවුන් පදිංචියට යෙද වූ වහාම ජාතික අයවැය චක්‍රලේඛ අංක 152 (II) හි සලසා ඇති විධිවිධාන අනුව වියළි සලාක ලබාදීමට වහාම පියවර ගත යුතුය.

2.2 ආපදාවට ලක් වුවද ඥාති මිත්‍රාදීන්ගේ නිවාස වල සහ තවදුරටත් තම මුල් වාසස්ථාන වල රැඳී සිටින පීඩාවට පත් වූ ජනතාව සඳහා ද ජාතික අයවැය චක්‍රලේඛ අංක 152 (II) යටතේ සලසා ඇති විධිවිධාන පරිදි වියළි සලාක ලබාදීම වහාම ඇරඹිය යුතුය.

2.3 වියළි සලාක ලබාදීම සඳහා විවිධ සේවා සමූපකාර සහ සතොස අලෙවිසැල් වලට අමතරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ මිළ ගණන් කැඳවා බාහිර සැපයුම්කරුවන්ගෙන් ද මිළ දී ගැනීම් සිදුකළ හැකිය.

**03.** <u>පාරිභෝගික භාණ්ඩ</u>

ආපදා හේතුවෙන් අහිමි වූ එදිනෙදා ජනජීවිතයට අත්‍යාවශ්‍ය වූ පාරිභෝගික භාණ්ඩ (කොට්ට, පැදුරු, ඇඳ ඇතිරිලි වැනි) එක් පවුලකට රු.5,000/- ක උපරිමයකට යටත්ව පීඩාවට පත් වූ ජනතාව සඳහා සැපයීමට ප්‍රාදේශීය ලේකම් විසින් පියවර ගත යුතුය.

04. <u>පාසැල් පොත් සහ උපකරණ</u>
ආපදා හේතුවෙන් පාසැල් දරුවන්ගේ අහිමි වූ පොත්පත්, උපකරණ සහ පාසැල් බෑගයක් සපයා ගැනීම සඳහා එක් පාසැල් දරුවෙකුට රු.2,000/- ක උපරිමයකට යටත්ව සැපයීමට ප්‍රාදේශීය ලේකම් පියවර ගත යුතුය.

05. <u>සෞඛ්‍යාරක්ෂිත සේවා</u>
5.1 ආපදා වලින් පීඩාවට පත්ව සුභ සාධන මධ්‍යස්ථාන වල රැඳී සිටින ජනතාවගේ සෞඛ්‍යාරක්ෂිත සේවා අඛණ්ඩව සැලසීමට සෞඛ්‍ය බලධාරීන් විසින් පියවර ගතයුතුය.
5.2 සහන සේවා මධ්‍යස්ථාන වලින් බැහැරව ඥාති මිත්‍රාදීන් සමග සහ සිය මුල් වාසස්ථාන වලම තවදුරටත් රැඳී සිටින පීඩාවට පත් ජනතාවගේ සෞඛ්‍යාරක්ෂණය පිළිබඳව ද අඛණ්ඩ වැඩපිළිවෙලක් සෞඛ්‍ය බලධාරීන් විසින් ක්‍රියාත්මක කළ යුතුය.
5.3 හානියට පත් සහ අවහිර වූ ළිං පිරිසිදු කිරීම සහ වැසිකිළි වලවල් පිරිසිදු කිරීම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ අධීක්ෂණය යටතේ සිදුකළ යුතුය.

06. <u>හානියට පත් නිවාස යථා තත්ත්වයට පත් කිරීම</u>
පීඩාවට පත් වූ ජනතාවගේ වාසස්ථාන යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ සහාය ලබා ගත යුතු අතර ඒ සඳහා වූ ප්‍රතිපදාන ත්‍රිවිධ හමුදාපතිවරුන් වෙත භාණ්ඩාගාරය විසින් සෘජුවම සපයනු ලැබේ. .

07. <u>ජලාපවාහන පද්ධති පිරිසිදු කිරීම</u>
ගංවතුරෙන් සහ නායයෑම් වලින් අවහිර වූ ජලාපවාහන පද්ධති පිරිසිදු කිරීම සහ නිවාස වල අවහිර වී ඇති වැසිකිළි වලවල් පිරිසිදු කිරීම පළාත් පාලන ආයතන මගින් කඩිනමින් සිදුකළ යුතුවේ.

08. <u>නායයෑම් වලින් හානියට පත් නිවාස ප්‍රතිසංස්කරණය සහ ඉදිකිරීම</u>
නායයෑම් වලින් විපතට පත්ව විකල්ප ඉඩම්වල නැවත පදිංචි කිරීමේදී නිවාස ඉදිකිරීම් ශ්‍රී ලංකා යුද හමුදාව විසින් සිදු කරනු ලබන අතර ඒ සඳහා වන ප්‍රතිපාදන යුද හමුදාපතිවරයා වෙත භාණ්ඩාගාරය විසින් සෘජුවම සපයනු ලැබේ.

09. <u>පීඩාවට පත් ජනතාව නැවත පදිංචි කිරීම</u>
රජයේ රක්ෂිත කලාප වල, අවදානම් කලාප වල සහ අනවසර ඉදිකිරීම් කොට පදිංචිව සිටි පීඩාවට පත් වූ ජනතාව සඳහා විකල්ප ඉඩම් ලබා දී ඔවුන් නැවත පදිංචි කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් පියවර ගත යුතුය.

10. <u>සෙවිලි තහඩු සැපයීම</u>
කඳුකර වතු ආශ්‍රිත ප්‍රදේශ වල හානියට පත් වූ නිවාස වල වහල පිළිසකර කිරීමට සෙවිලි තහඩු සැපයීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත භාණ්ඩාගාරය විසින් සෘජුවට ප්‍රතිපාදන සපයනු ලැබේ.

11. <u>ගෘහ භාණ්ඩ සහනාධාර</u>
ආපදා වලින් හානියට පත්/අහිමි වූ ගෘහ භාණ්ඩ මිල දී ගැනීම සඳහා රු.50,000/- ක උපරිමයකට යටත්ව පොලී රහිත ණයක් රාජ්‍ය බැංකු මගින් සපයනු ලබන බැවින් අදාළ බැංකු ශාඛා වලින් ඒ සඳහා ඉල්ලුම් කල යුතුය.

**12. <u>රාජ්‍ය සේවකයින් සඳහා ආපදා සහන</u>**

12.1 ආපදා වලින් පීඩාවට පත් රාජ්‍ය සේවකයින් සඳහා දැනට ලබාදෙනු ලබන මාස 10 ක සහ උපරිමය රු.250,000/- ක ආපදා ණය සීමාව මාස 20 දක්වා සහ රු.500,000/- ක උපරිමයකට යටත්ව රාජ්‍ය බැංකු වලින් සෘජුවම ලබා ගත හැකි වේ. 4.2% ක පොලී අනුපාතය රාජ්‍ය සේවකයින් ගෙවිය යුතු අතර බැංකු වලින් සපයනු ලබන පොලී වෙනස භාණ්ඩාගාරය විසින් අදාළ බැංකු වෙත ගෙවනු ලැබේ.

12.2 මෙම පහසුකම ක්ෂණිකව ලබාගැනීමට අපේක්ෂා කරන පීඩාවට පත් රාජ්‍ය සේවකයින් තමන්ට පහසු රාජ්‍ය බැංකු ශාඛාවකින් මෙම පහසුකම් ලබා ගැනීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන වැටුප් සහතිකය ඉදිරිපත් කර ණය පහසුකම ලබාගත යුතුය.

12.3 රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය සමාගම් හා ආයතන වල නිලධාරීන්ටද මෙම පහසුකම එම ආයතන මගින් මෙහෙයවන වැඩසටහන් යටතේ ලබා ගත හැකිය.

පීඩාවට පත්ව ඇති ජනතාව වෙත කාර්යක්ෂමව සහ අප්‍රමාදව සහන සැලසීම සඳහා ක්ෂේත්‍ර මට්ටමේ ඕනෑම රාජ්‍ය සේවයකයෙකුගේ සේවය අදාළ දිස්ත්‍රික් ලේකම්ගේ සහ ප්‍රාදේශීය ලේකම්ගේ අභිමතය පරිදි අවස්ථානුකූලව ලබාගත හැකිය.

මෙම චක්‍රලේඛයෙන් ආවරණය නොවන එහෙත් ආපදා තත්ත්වයන් මත අවශ්‍ය වැඩිදුර උපදෙස් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ඇති අතර, මෙම චක්‍රලේඛයේ යම්කිසි පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ නම් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් (දුරකථන අංක 011-2484665) විමසිය යුතුය.

පී.බී. ජයසුන්දර
ලේකම්
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්
5. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්
6. ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්
7. පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්
8. සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්

(4–8) අදාළ වන පරිදි නිලධාරීන් වෙත උපදෙස් නිකුත් කිරීම සඳහා

9. සභාපති, ලංකා බැංකුව
10. සභාපති, මහජන බැංකුව
11. සභාපති, ජාතික ඉතිරි කිරිමේ බැංකුව
12. සභාපති, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

(9–12) අදාළ වන පරිදි බැංකු පහසුකම් සැපයීම සඳහා

13. විගණකාධිපති